දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) TCS/H/PF/15891
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2016.05. 03
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරු/පළාත් මහ රෝහල් අධ්‍යක්ෂවරු/දිස්ත්‍රික් මහරෝහල් අධ්‍යක්ෂවරු,
සියලුම විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරු,
සියලුම මුලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්,

**<u>නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත් කිරිම.</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක HSC/ PRO/DMAG/10/11/2017 හා 2019.04 .17 දිනැති ලිපිය මගින් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත්විම සඳහා කුසලතා අනුපිලිවෙල යටතේ සුදුසුකම් ලබා ඇති නිලධරයන් 146 දෙනෙකුගේ නාම ලේඛණය 2019.04.29 දිනැතිව අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකර ඇත.

02. එම නාම ලේඛණයේ නිලධාරින් 2019.05.06 දින හෝ එදිනට පෙර ඔවුන් ලබා ඇති කුසලතාව අනුව නම් කර ඇති සේවා ස්ථානයේ රාජකාරි සඳහා වර්තා කලයුතු අතර, එසේ සේවයට වාර්තා කල නිලධාරින් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පත්විම් ලබාගැනිමට සුදුසුකම් සම්පූර්ණ වන බවද සඳහන් කරමි. නියමිත දිනට සේවයට වාර්තා කිරිමට අපොහොසත් වන නිලධාරින්ට නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පත්විම අහිමි වන බවද කාරුණිකව සඳහන් කරන අතර දැනට විදේශ ගතව සිටින නිලධාරින් 2019.05.20 දිනට ප්‍රථම රජකාරි සඳහා වාර්තා කළ යුතු දැනුම් දෙමි.

03. ඒ අනුව නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ රාජකාරි සඳහා වාර්තා කරන නව නිලධාරින් සේවයට වාර්තා කළ වහාම ඒ බව විධිමත් පරිදි මා වෙත දැනුම් දිය යුතු අතර, එසේ වාර්තා නොකරන නිලධාරින්ගේ තනතුරු සඳහා කුසලතා ලේඛණයේ අනුපිලිවෙලට නිලධාරින් තොරා පත්කරන බවද දැනුම් දෙමි.

04. තවද, විටින් විට මෙම අමාත්‍යාංශය විසින් රාජකාරි ආවරණය /වැඩ බැලිමේ පදනමින් එකි තනතුරු සඳහා පත්කර ඇති නිලධාරින් එම තනතුරු වලින් නිදහස් කර නව පත්විම්ලාභීන්ට තනතුරු භාර ගැනිමට සලස්වන මෙන් ද දැනුම් දෙමි.

05. තවද, දැනට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින ආයතනවල සේවයට වාර්ථා කරනු ලබන නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිත්‍ය නිලධාරින් විසින් එම ආයතනයේ පුරප්පාඩු වි ඇති ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ රාජකාරි ආවරණය කිරිමටද මින් අනුමැතිය ලබා දෙමි.

06. ඒ අනුව අවශ්‍ය කටයුතු ඉටු කරන මෙන් කාරුණිකව දැණුම් දෙමි.

වසන්තා පෙරේරා
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාං...
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ලේකම්